www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA COLOMBO 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | ඉතිහාසය | 7 ඒකකය |
|---|---|---|

## වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නව රාජධානි බිහි වීම.

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. 1344 දී ලංකාවට පැමිණි ආර්ය චක්‍රවර්තීගේ උපකාරයෙන් ශ්‍රීපාද වන්දනාවට ගිය විදේශිකයා වන්නේ,

    (1). චෙන් හෝ සෙන්පති (3). පාහියන් හිමි

    (2). හියුං සාන් හිමි (4). ඉබන්බතුතා

- පහත වගුව සැලකිල්ලට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | යුගය | කළ නිර්මාණ |
|---|---|---|
| A. III වන වික්‍රමබාහු | D. කෝට්ටේ | G. ඇම්බැක්කේ දේවාලය |
| B. VI වන බුවනෙකබාහු | E. දඹදෙනිය | H. සිංහලසංගය |
| C. II වන පැරකුම්බා | F. ගම්පොළ | I. කව්සිළුමිණ |

02. III වන වික්‍රමබාහු රජ දවස කරන ලද ඉදිකිරීමක් සහ එම රජතුමාගේ රාජධානිය දැක්වෙන පිළිතුර වන්නේ,

    (1). E හා H (2). E හා G (3). F හා G (4). F හා I

03. කව්සිළුමිණ පද්‍ය කෘතිය රචනා වූ යුගය හා රජු දැක්වෙන අක්ෂර දෙක සඳහන් කරන්න.

    (1). A හා F (2). D හා B (3). C හා D (4). E හා C

04. පළමු වන නාගරීකරණය සඳහා පසුබිම නිර්මාණය වීමේදී ප්‍රාදේශීය ප්‍රභූවරු ලෙස කටයුතු කළ පරුමකවරු තම පවුල්වල කීර්තිය පවත්වාගැනීම සඳහා අනුගමනය කළ උපක්‍රමය කුමක්ද?

    (1). නාගරීකරණයට ලක්වූ ප්‍රදේශවලට අවතීර්ණ වීම

    (2). විදේශවලින් ආනයනය කළ භාණ්ඩ පරිහරණයට යොමු වීම

    (3). රට තුළට ගලා ආ ආදායම පරිපාලනය කිරීමට පාලන තන්ත්‍රයක් ගොඩනගා ගැනීම

    (4). නිෂ්පාදන අතිරික්තයක් පවත්වාගෙන යාම

05. ඉබන් බතුතා නම් අරාබි සංචාරකයා ලංකාවට පැමිණි යුගය ලෙස සැලකෙන්නේ,

    (1). දඹදෙනි යුගය (3). ගම්පොළ යුගය

    (2). කුරුණෑගල යුගය (4). කෝට්ටේ යුගය

06. පොළොන්නරුව රාජධානිය බිඳවැටීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ,

    (1). කාලිංග මාඝ ආක්‍රමණය (3). කාලිංග පාණ්ඩ්‍ය වංශික ගැටුම්

    (2). දුර්වල පාලකයන් බලයට පත් වීම (4). ආර්ථික පරිහානිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

07. කුරුණෑගල රාජධානියේ ප්‍රථම පාලකයා වූයේ,
(1). දෙවන බුවනෙකබාහු රජතුමා
(2). පළවන බුවනෙකබාහු රජතුමා
(3). හයවන බුවනෙකබාහු රජතුමා
(4). නිශ්ශංක අලකේශ්වර

08. සිංහල පෙරළිය නමින් හඳුන්වන කැරැල්ල ඇති වූයේ කවර පාලකයෙකුගේ සමයේද?
(1). හයවන පරාක්‍රමබාහු රජ සමයේ
(2). හයවන බුවනෙකබාහු රජ සමයේ
(3). හත්වන පරාක්‍රමබාහු රජ සමයේ
(4). අටවන වීරපරාක්‍රම රජ සමයේ

- පහත සඳහන් සිදුවීම් ඇසුරින් 09 සහ 10 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. බෙලිගල දළදා මාලිගයක් ඉදිකිරීම
B. මහනුවර අස්ගිරි සේනාසන විහාරය ඉදිකරවීම
C. දළදා පූජාවලිය ලියවීම
D. කැළනි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම
E. පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම
F. ජෝතිය සිටාණන් ඇතිකළ කැරැල්ල මැඩපැවැත්වීම

09. දඹදෙනියේ II වන විජයබාහු රජතුමා හා සම්බන්ධ පිළිතුර කුමක්ද?
(1). AC (2). BD (3). AD (4). DF

10. කුරුණෑගල රාජධානියේ IV වන පරාක්‍රමබාහු රජතුමා ඉටුකළ සේවාවන් වන්නේ,
(1). BE (2). CE (3). EF (4). BD

11. අභ්‍යන්තර වෙළඳාම සම්බන්ධ කඩවීදි තිබූ බව සඳහන් මූලාශ්‍රය කුමක්ද?
(1). කුරුණෑගල විස්තරය
(2). ආලම්පුරි සන්නස
(3). පූජාවලිය
(4). දඹදෙනිය කතිකාවත

12. යාපහුව රාජධානියේ පිටගැටපෙළ හා කුළුණු නිර්මාණය සඳහා ආභාසය ලබා ඇතැයි විශ්වාස කෙරෙන්නේ,
(1). චෝල හා පාණ්ඩ්‍ය
(2). චෝල හා කේරල
(3). පර්සියානු හා කාම්බෝජ
(4). කාම්බෝජ හා පාණ්ඩ්‍ය

13. පහත සඳහන් සිදුවීම් ඇසුරින් කාලිංග මාඝ ආක්‍රමණය පැවති අවධියේ ජීවත්වූවකුට අසන්නට හෝ දැනගැනීමට ලැබෙන සිදුවීම ඇතුළත් පිළිතුර කුමක්ද?
(1). මහනුවර දළදා මාලිගය ඉදිකිරීම
(2). සුලෙයිමාන් නමැති දේශගවේශකයකු ශ්‍රීපාදය වන්දනා කිරීම
(3). සිංහල සංගෙ නමින් හැඳින්වූ කැරැල්ල ඇති වීම
(4). යාපනය ප්‍රදේශය පාලනය කිරීමට සෂිගිරි නම් ඇමතිවරයා පත් කිරීම

14. ගම්පොළ රාජධානි සමයේ මාතෘ මූලික උරුමයට රජකම හිමි වීමේ සම්ප්‍රදායයට අනුව මාමාගෙන් පසු බෑණාට රජකම හිමි වූයේ කාටද?
(1). හයවන පරාක්‍රමබාහු රජතුමාට
(2). සිව්වන විජයබාහු රජතුමාට
(3). තුන්වන වික්‍රමබාහු රජතුමාට
(4). හත්වන පරාක්‍රමබාහු රජතුමාට

Agaram.LK - Keep your dreams alive!

15. යාපනය රාජ්‍ය බිඳවැටීමට බලපෑ ප්‍රබල හේතුවක් නොවේ
    (1). උඩරට රාජධානිය මෙන් ස්වභාවික ආරක්ෂාවක් නොතිබීම
    (2). රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගලය
    (3). ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොමැතිකම
    (4). පෘතුගීසීන්ට ගැති පාලකයකු සිංහාසනයට පත් කිරීම

16. ''කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත'' යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ රජ වූයේ,
    (1). පළමුවන පරාක්‍රමබාහු
    (2). දෙවන පරාක්‍රමබාහු
    (3). තුන්වන පරාක්‍රමබාහු
    (4). හතරවන පරාක්‍රමබාහු

17. පෘගුගීසින් ලංකාවට පැමිණෙන විට යාපනය රාජධානියේ පාලකයා වූයේ,
    (1). පරරාජසේකරම් ය
    (2). පුවිරාජපණ්ඩරම් ය
    (3). සංකිලි රජුය
    (4). එදිරිමාන්නසිංහම් රජුය

18. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයේ මූලික ලක්ෂණ පෙන්නුම් කරන නගර දෙක වන්නේ,
    A. අනුරාධපුර
    B. මහනුවර
    C. මාගම
    D. පොළොන්නරුව
    (1). A, C (2). A, B (3). B, C (4). A, D

19. ගම්පොළ රාජධානි සමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණය නොවන්නේ,
    (1). හින්දු හා මහායාන බලපෑම් නිසා පිළිමගෙවල්වල දේවාල ඉදිකිරීමය
    (2). සන්දේශ කාව්‍ය ලිවීම ආරම්භ කිරීමය
    (3). මව් පාර්ශවයෙන් රාජ්‍ය උරුම වීමේ ක්‍රමයක් ආරම්භ වීම
    (4). රාජ්‍ය උරුමය එකම රාජකීය පවුලක පියපුතු ක්‍රමයට හිමිවීමය

20. A. බෙලිගල පර්වතය මුදුණේ දළදා මාලිගයක් කරවීම
    B. සද්ධර්මරත්නාවලිය පොත රචනාවීම
    C. ජාතක කථා පොත සිංහලයට පරිවර්තනය කිරීමට අනුග්‍රහය දැක්වීම
    D. චන්ද්‍රභානු දෙවරක් පරාජය කිරීම
    ඉහත A, B, C හා D ලෙස දක්වා ඇති ඓතිහාසික සිද්ධි අතරෙන් II වන පරාක්‍රමබාහු රජ සමයට අදාළ සිද්ධි ඇතුළත් පිළිතුර කුමක්ද?
    (1). A හා B (2). A හා C (3). B හා C (4). B හා D

21. යාපහුව රාජධානියේ ප්‍රථම පාලකයා වූයේ,
    (1). හතරවන විජයබාහුය
    (2). පළමුවන බුවනෙකබාහුය
    (3). හතරවන පරාක්‍රමබාහුය
    (4). දෙවන බුවනෙකබාහුය

22. පාත්‍රා ධාතුව හා දන්ත ධාතුව දඹදෙණි රාජ්‍යයට වැඩමවා බෙලිගල දළදා මාලිගාවක් කරවා එහි තැන්පත් කොට නීත්‍යානුකූල රාජ්‍යත්වය හිමිකරගත් පාලකයා කවුරුන්ද?
    (1). දෙවන පරාක්‍රමබාහු රජතුමා
    (2). පළමුවන පරාක්‍රමබාහු රජතුමා
    (3). තුන්වන විජයබාහු රජතුමා
    (4). හතරවන පරාක්‍රමබාහු රජතුමා

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

23. පහත A තීරුවේ සඳහන් සාහිත්‍ය කෘති B තීරුවේ සඳහන් යුගයක් සමඟ නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A තීරුව | B තීරුව |
|---|---|
| i. කව්සිළුමිණ, සද්ධර්මරත්නාවලිය | A. කුරුණෑගල යුගය |
| ii. දළදා පූජාවලිය, සිංහල බෝධි වංශය | B. කෝට්ටේ යුගය |
| iii. මයුර සන්දේශය, තිසර සන්දේශය | C. දඹදෙණි යුගය |
| iv. බුදුගුණඅලංකාරය, ලෝවැඩසඟරාව | D. ගම්පොළ යුගය |

(1). BACD (2). CABD (3). CADB (4). DBAC

- පහත සඳහන් රජවරු පිළිබඳ අධ්‍යයනය කොට 24, 25, 26 යන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A. දෙවන බුවනෙකබාහු
B. හයවන පරාක්‍රමබාහු
C. තුන්වන විජයබාහු
D. හතරවන පරාක්‍රමබාහු
E. දෙවන පරාක්‍රමබාහු
F. පස්වන පරාක්‍රමබාහු

24. සාහිත්‍ය දියුණුවට අනුග්‍රහය දක්වූ රජවරු දැක්වෙන පිළිතුර වන්නේ,

(1). D හා E (2). B හා E (3). E හා F (4). B හා C

25. කුරුණෑගල රාජධානියේ රජකළ රජවරුන් දෙදෙනෙක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1). A හා D (2). B හා F (3). E හා D (4). B හා C

26. තම බල ප්‍රදේශය ආරක්ෂා කරගැනීමේ අරමුණින් අගනුවරවල් තෝරාගත් රජවරුන් දෙදෙනා ඇතුළත් පිළිතුර වන්නේ,

(1). C හා F (2). B හා D (3). B හා F (4). A හා F

27. පහත සඳහන් සිදුවීම් අතුරෙන් කුරුණෑගල රාජධානි සමයේ ලංකාවට පැමිණි විදේශිකයකුට අසන්නට හෝ දකින්නට ලැබෙන සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක්ද?

A. දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් ජාවක චන්ද්‍රභානු පරාජය කිරීම.
B. යාපනයේ පාලකයා ලෙස සපුමල් කුමරු කටයුතු කිරීම.
C. පස්වන මිහිඳු රජු සිරකරුවකු ලෙස ඉන්දියාවට ගෙනයාම.
D. භික්ෂූන්ගේ විනය නීති පිළිබඳ දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම
E. චෙංහෝ සෙන්පතියා ලංකාව ආක්‍රමණය කිරීම.

(1). A, C හා D (2). C, D හා E (3). B, C හා D (4). A, D හා E

28. ගාල්ලේ ත්‍රිභාෂා ලිපිය යනු,

(1). චීන, පර්සියානු හා දෙමළ භාෂාවලින් ලියන ලද ශිලා ලිපියක්
(2). සිංහල, දෙමළ හා හින්දු බසින් ලියන ලද ලිපියක්
(3). ඉංග්‍රීසි, ලන්දේසි, පෘතුගීසි බසින් ලියන ලද ලිපියකි
(4). පාලි, සංස්කෘත හා ප්‍රාකෘත බසින් ලියන ලද ලිපියකි


agaram.lk

29. මලයරටට අයත් රාජධානි වේ.

(1). කෝට්ටේ, රයිගම, සීතාවක
(2). පොළොන්නරුව, අනුරාධපුරය
(3). මහනුවර, ගම්පොල
(4). පඬුවස්නුවර, දඹදෙණිය, යාපහුව

30. I වන බුවනෙකබාහු රජතුමාගේ කාලයේ සිදු වූ සිදුවීමකි.

(1). ඉබන් බතුතා ලංකාවට පැමිණීම
(2). චෙන් හෝ ගේ ආක්‍රමණය
(3). ඊජිප්තුවේ සුල්තාන් සමඟ ඇති වූ විදේශ සබඳතා
(4). චන්ද්‍රභානුගේ ආක්‍රමණය

31. කාලිංගරායර් සහ චොඩාංග ගේ ආක්‍රමණයට මුහුණදුන් රජතුමා වන්නේ,

(1). දෙවන බුවනෙකබාහු රජතුමා
(2). දෙවන පරාක්‍රමබාහු රජතුමා
(3). පළමුවන බුවනෙකබාහු රජතුමා
(4). තෙවන විජයබාහු රජතුමා

32. ගෝවින්දමලය නම් කඳු මුදුනෙහි බලකොටුවක් තනාගෙන සතුරන් රුහුණට ඇතුළුවීම වැළැක්වූයේ,

(1). බුවනෙකබාහු ආදිපාදවරයාය
(2). සංඛ සෙනෙවියාය
(3). සවුළු විජයබාහුය
(4). සුභ සෙනෙවියාය

33. පොළොන්නරුව නගරයේ පිහිටා ඇති වැවක් වන්නේ,

(1). මින්නේරි වැව (2). ගිරිතලේ වැව (3). කවුඩුළු වැව (4). පරාක්‍රම සමුද්‍රය

34. පොළොන්නරුව රාජධානිය බිඳවැටීමට බලපෑ ආසන්නතම හේතුව වන්නේ,

(1). මධ්‍යගත පාලන බිඳවැටීම
(2). වෙළඳාම හා ගමනාගමන කටයුතු බිඳවැටීම
(3). දුර්වල පාලනය
(4). කාලිංග මාඝ ආක්‍රමණය

35. තෙවන විජයබාහු රජතුමාගෙන් සිදු වූ සේවාවක් නොවේ.

(1). පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.
(2). බෙලිගල දළදා මැදුරක් කරවා පූජනීය වස්තු එහි තැන්පත් කිරීම.
(3). උපසම්පදා මංගල්‍යය පවත්වා සංඝ සංශෝධනයක් කිරීම.
(4). අභාවයට ගොස් තිබූ පොතපත නැවත ලියවීම.

36. කලිකාල සාහිත්‍ය සර්වඥ යන උපාධි නාමයෙන් පිදුම් ලැබුවේ

(1). I වන විජයබාහු රජතුමාය
(2). I වන බුවනෙකබාහු රජතුමාය
(3). II වන පරාක්‍රමබාහු රජතුමාය
(4). II වන බුවනෙකබාහු රජතුමාය

| රාජධානිය | රජතුමා | සිදුවීම |
|---|---|---|
| A. දඹදෙණිය | E. II වන බුවනෙකබාහු | I. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය |
| B. කෝට්ටේ | F. III වන විජයබාහු | J. බෙලිගල දළදා මාලිගයක් ඉදිකිරීම |
| C. ගම්පොළ | G. VI වන පරාක්‍රමබාහු | K. පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම |
| D. කුරුණෑගල | H. V වන පරාක්‍රමබාහු | L. රජ පරපුර සමඟ ප්‍රභූ පවුල් දෙකක් සම්බන්ධ වීම |

- ඉහත වගුව ආශ්‍රයෙන් 37 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

37. දඹදෙණිය රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර කුමක්ද?

(1). AGI (2). AFJ (3). AEL (4). AHK

38. ගම්පොළ රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර කුමක්ද?

(1). CGI (2). CEI (3). CHL (4). CFK

39. කෝට්ටේ රාජධානිය සම්බන්ධයෙන් අදාළ පිළිතුර වන්නේ,

(1). BGI (2). BFK (3). BEL (4). BHJ

40. ලංකාතිලක හා ගඩලාදෙණිය යන විහාර ඉදිකරන ලද්දේ,

(1). දඹදෙණි යුගයේදීය
(2). කෝට්ටේ යුගයේදීය
(3). ගම්පොළ යුගයේදීය
(4). මහනුවර යුගයේදීය

## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත දී ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර දක්වන්න.

දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ, ගම්පොළ, රයිගම, සීතාවක, පඬුවස්නුවර, මහනුවර, කැළණිගඟ, කළුගඟ, අනුරාධපුරය, මීඔය (ල.12)

02. (I). පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. චෝලයන්ගෙන් රට නිදහස් කර පොළොන්නරුව අගනුවර බවට පත්කරගත් රජතුමා.
B. ගංදෙනිය පර්වතයේ දුර්ගයක් පිහිටුවාගෙන පාලනය කළ සෙනෙවියා.
C. ක්‍රි.ව. 1261 දී දඹදෙණිය ආක්‍රමණය කළ ආක්‍රමණිකයා කවුද?
D. ඇම්බැක්කේ දේවාලය ඉදිකළ රජතුමා කවුද?

(II). පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A



(1). A වලින් දක්වා ඇති නිර්මාණය කුමක්ද?
(2). මෙය ඉදිකළ රජතුමාගේ නම කුමක්ද?
(3). මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය නම් කරන්න.
(4). මෙහි දක්නට ලැබෙන ගල්කණු කුමන ගෘහ නිර්මාණයක නටඹුන්ද?

B



(1). B වලින් දක්වා ඇති නිර්මාණය කුමක්ද?
(2). එය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක්ද?
(3). මෙය ඉදිකළ රජතුමා කවුරුන්ද?
(4). මෙවැනි නිර්මාණ වල්බිහිවීමට බලපෑ හේතුව කුමක්ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

(II). පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි ලියා දක්වන්න.

A. රජරට කාලිංග මාඝ පාලනය පැවති සමයේ ගෝවින්ද මලයෙහි සිටි ප්‍රාදේශීය පාලකයා.

B. කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් ඉදිකළ පුද්ගලයා.

C. ක්‍රි.ව. 1411 දී චෙංහෝ නමැති චීන සෙන්පතියා විසින් තම රටටම සිරකරුවකු ලෙස ගෙනගිය රයිගම පාලකයා.

D. හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදී උඩරට ජෝතිය සිටාණන් ඇති කළ කැරැල්ල මැඩපැවැත්වීමට යැවූ පුද්ගලයා.

(III). IV වන පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික හා සාහිත්‍ය සේවාව නිදසුන් 2 ක් දක්වා විස්තර කරන්න.

(IV). 13 වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා වූ කාලය තුළ මෙරට,

A. ගෘහ නිර්මාණ ශිල්පය

B. කැටයම් කලාව

යන ක්ෂේත්‍රවල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දක්වා පැහැදිලි කරන්න.

03. (I). පහත සඳහන් රාජධානි තුනේ ආරම්භක පාලකයින් තිදෙනා අනුපිළිවෙලින් නම් කරන්න.

- ❖ දඹදෙනිය
- ❖ කුරුණෑගල
- ❖ ගම්පොල (ල.03)

(II). හයවන පරාක්‍රමබාහු රජතුමා ඉටුකළ කාර්යයන් 4 ක් ලියන්න. (ල.04)

(III). දඹදෙනියේ දෙවන පරාක්‍රමබාහු රජු,

(a) විදේශීය ආක්‍රමණයන්ගෙන් රට බේරා ගැනීමට කටයුතු කළ ආකාරය හා

(b) සාහිත්‍ය උදෙසා කරන ලද සේවාව කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

(IV). දෙවන නාගරීකරණයේ ආර්ථික රටාවේ කැපී පෙනෙන ලක්ෂණ 3ක් ලියා පැහැදිලි කරන්න. (ල.06)

04. (I). පොළොන්නරු රාජධානිය බිඳවැටීමට තුඩුදුන් හේතු 3ක් දක්වන්න. (ල.03)


(II). A - කුරුණෑගල

B - කෝට්ටේ රාජ්‍ය සමයේ ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ දෙක බැගින් පහත වරහන් තුළින් තෝරා ලියන්න.

(දළදා සිරිත, කව්සිළුමිණ, පන්සිය පනස් ජාතක පොත, සිදත් සඟරාව, බුදුගුණඅලංකාරය, සද්ධර්මාලංකාරය, ලෝවැඩ සඟරාව)

*සැකසුම: එම්.ජී.එස්. දිල්රුක්ෂි කුමාරි මිය*

Agaram.LK - Keep your dreams alive!



Agaram.LK - Keep your dreams alive!